# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2304/05 - 2022 ඔක්තෝබර් මස 31 වැනි සඳුදා - 2022.10.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනත**

1985 අංක 48 දරන සහ 1987 අංක 28 දරන පනත් මඟින් සංශෝධිත 1969 අංක 1 දරන ආනයන හා අපනයන (පාලන) පනතේ 4 වන වගන්තියේ (1) වන උප වගන්තිය සහ 14 වන වගන්තිය සමඟ කියවිය යුතු, 20 වන වගන්තිය යටතේ මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය, රනිල් වික්‍රමසිංහ වන මවිසින් සාදනු ලබන රෙගුලාසි.

**රනිල් වික්‍රමසිංහ,**
මුදල්, ආර්ථික ස්ථායීකරණ
සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍ය.

2022 ඔක්තෝබර් මස 31 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික ස්ථායීකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යාංශයේ දී ය.

**රෙගුලාසි**

1. මෙම රෙගුලාසි **"2022 අංක 20 දරන ආනයන හා අපනයන (පාලන) රෙගුලාසි"** ලෙස හඳුන්වනු ලැබේ.

2. වරින් වර සංශෝධනය කරන ලද, 2017 නොවැම්බර් මස 09 දිනැති අංක 2044/40 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසි, මෙමගින් තවදුරටත් සංශෝධනය කෙරේ.

3. ඉහතින් සඳහන් කරන ලද විශේෂ ආනයන බලපත්‍ර රෙගුලාසිවල **I වන උපලේඛනයෙහි** ලැයිස්තුගත කර ඇති සහ **එච්. එස්. ශීර්ෂ 88.03** යටතේ වර්ග කර ඇති පහත සඳහන් භාණ්ඩ, **ඕනෑම අනුමත ජාත්‍යන්තර ගුවන් සේවා ක්‍රියාකරුවන් විසින් අනුමත රේගු බන්ධිත ප්‍රදේශ තුල ගුවන් යානා අලුත්වැඩියා කිරීම / නඩත්තු කිරීම සඳහා ශ්‍රී ලංකා සිවිල් ගුවන්** සේවා අධිකාරියේ සභාපතිවරයාගේ හෝ අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ නිර්දේශය මත ආනයනය කිරීම, ආනයන පාලන බලපත්‍ර (අයි. සී. එල්.) අවශ්‍යතාවයෙන් නිදහස් කරනු ලැබේ.

1A - PG 6030 — 406 (2022/11)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

| I තීරුව<br>ශීර්ෂ අංකය | II තීරුව<br>සංයෝජිත වර්ගීකරණ සංකේතය | | III තීරුව<br>විස්තරය |
|---|---|---|---|
| 88.03 | | | **88.01 හෝ 88.02 ශීර්ෂයේ භාණ්ඩ වල කොටස්.** |
| | 8803.10.00 | - | අවර රෝද සහ රෝටර් සහ ඒවායේ කොටස් |
| | 8803.20.00 | - | වාහන යටි-කුඩු සහ ඒවායේ කොටස් |
| | 8803.30.00 | - | අහස් යානා හෝ හෙලිකොප්ටර් වල අනෙකුත් කොටස් |
| | 8803.90.00 | - | අනෙකුත් |

4. රෙගුලාසි අංක 3 හි නිශ්චිතව දක්වා ඇති පරිදි සිවිල් ගුවන් සේවා අධිකාරියේ නිර්දේශය;

(අ) රේගු නිෂ්කාශනය සඳහා ශ්‍රී ලංකා රේගුව වෙත, සහ

(ආ) නැව්ගත කිරීමේ ලේඛන නිකුත් කිරීම සඳහා සහ / හෝ ණයවර ලිපියක් (එල්. සී.) ස්ථාපිත කිරීම සඳහා සහ ගෙවීම සිදු කිරීම සඳහා ඔවුන්ගේ බලපත්‍රලාභී බැංකුව වෙත ඉදිරිපත් කිරීම සිදු කල යුතුය.

5. මෙම රෙගුලාසිවල අරමුණු සාක්ෂාත් කර ගැනීමට මෙම රෙගුලාසි ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම උදෙසා ආනයන හා අපනයන පාලක ජනරාල් විසින් ශ්‍රී ලංකා රේගුව සහ බලපත්‍රලාභී බැංකු වෙත අවශ්‍ය "මෙහෙයුම් උපදෙස්" නිකුත් කරනු ලැබේ.

EOG 11 - 0076

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.